ගිංතොට ප්‍රදේශයේ දුම්රිය මාර්ගයක ඇණ ගැලවීමේ සිදුවීමක් අරුණ (10/27) සහ මව්බිම (10/27) තුළින් වාර්තා කර තිබුණි. මෙහිදී අරුණ පුවත්පත සිරස්තලය තුළින් වාර්තා කළේ එම සිද්ධියට පොලීසිය "මත්ලෝලීන්" සැක කරන බවය. පුවත් අන්තර්ගතය තුළ එය "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්" සිදුකල බව දක්වා තිබිණි. මෙම පුවත මව්බිම පුවත්පත වාර්තා කොට තිබුණේ, "මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්" යනුවෙන් අදාළ සැකකරුවන්ව හඳුන්වමිනි.

මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු හුදු මත්ද්‍රව්‍ය වෙත ලොල් වීමක් නොව, වඩාත් සංකීර්ණ කරුණු ගණනාවක් හා සිදුවන්නකි.

ඒ අනුව ගත් විට,

1) මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු හුදු මත්ද්‍රව්‍ය වෙත ලොල්වීමක් ලෙසින් දැක්වීම ඔස්සේ, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීම පිළිබඳවත්, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන්නන් පිළිබඳවත් වැරදි මතයක් සමාජගත නොවන්නේද?

2) "මත් ලෝලීන්" යන යෙදුම වෙනුවට, "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්" යන යෙදුම වඩාත් යෝග්‍ය වේ යැයි ඔබ නොසිතන්නේද?

"මත් ලෝලීන්" සහ "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්" යන යෙදුම් අතුරින් ඔබ තෝරාගන්නේ කුමන යෙදුමද?

**#MediaEthicsSL #lka #sinhalanews #Aruna #Mawbima**